8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# පරිසර දූෂණය අවම කිරීමෙහි ලා බෞද්ධ පාරිසරික ආචාරධර්මයන්හි උපයෝගීතාව

නන්ද හිමි ජී. සහ විජේසූරිය ආර්.එම්.පී.ජී.එන්.කේ.

සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය,
භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමිය, ශ්‍රී ලංකාව
gonalagodananda@gmail.com

**සාරසංක්ෂේපය**

පරිසරය ස්වාභාවික පරිසරය හා ස්වාභාවික නො වන පරිසරය යනුවෙන් කොටස් ද්වයකට වර්ග කළ හැකි ය. ස්වාභාවික ව හටගත් අවට ඇති ද්‍රව්‍ය වස්තූන් ස්වාභාවික පරිසරය යනුවෙන් ද මානව මැදිහත් වීමෙන් යුක්ත ව ගොඩනගන ලද පරිසරය ස්වාභාවික නො වන පරිසරය යනුවෙන් ද අර්ථ දැක්වේ. වාස්තවික අර්ථයෙන් බැලීමේ දී පරිසරය යනුවෙන් නිර්වචනය කරන්නේ මිනිසා ඇතුළු අවට ඇති ලෝකය යි. සතුන්, වනාන්තර, ගංගා, ඇළ, දොළ, ජලය, වාතය, ආදී මිනිසා ඇතුළු සියල්ල පරිසරය වේ. මෙකී පරිසරය වර්තමානය වන විට දැඩි අර්බුදයකට පත් ව තිබේ. ප්‍රධාන වශයෙන් දේශගුණික වෙනස්වීම්, මිහිතලය උණුසුම් වීම, ජල, වායු, වනාන්තර, පාංශු, ශබ්ද, ජෛව විවිධත්ව වැනි දෑ මානව පැවැත්ම හමුවේ දැඩි අර්බුදයකට ලක්ව තිබේ. මෙවැනි පාරිසරික අර්බුද අවම කිරීමට බෞද්ධ පාරිසරික ආචාරධර්ම උපයෝගී කරගත හැකි ය. එබැවින් සන්ධාර පර්යේෂණ ක්‍රමවේදය යටතේ මේ පිළිබඳ මෙහි ලා සාකච්ඡා කෙරේ. පරිසරය සම්බන්ධයෙන් බෞද්ධ විග්‍රහයෙහි දැකිය හැකි වනුයේ පරිසර කේන්ද්‍රවාදී (Eco centrism) අදහසකි. මානව කේන්ද්‍රවාදී අදහසක් නොමැති බැවින් මිනිසා පරිසරයෙන් විතැන් නො වේ. ඒ අනුව බුදු දහමෙහි පරිසරය යනුවෙන් අර්ථ විභාග කරනුයේ මිනිසා ද ඇතුළු සමස්ත වටපිටාව යි. පූර්වයෙහි වෙන් වශයෙන් දක්වන ලද පාරිසරික අර්බුදවලට අයත් ගැටලු අවම කිරීමට අදාළ දේශනා බෞද්ධ පාරිසරික ආචාරධර්මවල ඇතුළත් වේ (සූත්‍ර-විනය පිටක). බුදුරජාණන් වහන්සේ පරිසරයෙහි තුලිත බව රැක ගැනීමට අදාළ ව දේශනා කර ඇත්තේ වන රෝපණය හා පැන්-පොකුණු තැනවීම පිං සිදු වන ක්‍රියාවන් වශයෙනි. පරිසරයෙහි තුලිත බවට සියලු ජෛව පද්ධතීන් අවශ්‍යමය සාධකයකි. සියලු ජෛව පද්ධති පැවතුණහොත් පරිසර අතුලිත බවක් නිර්මාණය නො වේ. පරිසරය දූෂණයට ප්‍රධාන හේතු වනුයේ අල්පේච්ඡ ගුණය නොමැති වීම, කෘතගුණ නො සැලකීම හා තෘෂ්ණාව යි. බුදුරජාණන් වහන්සේ ද අනිමිසලෝචන පූජාව මඟින් බෝධීන් වහන්සේට කෘතගුණ සලකා තිබේ. එයින් පරිසරයෙහි හා මිනිසා අතර අන්‍යෝන්‍ය බැඳීම විස්තර කරයි. මිනිසා අධික තෘෂ්ණාවෙන් යුක්ත ව ආර්ථිකයට සමීප වීම හේතුවෙන් හා අල්පේච්ඡ බවක් නොමැතිකමින් පරිසර හායනය කරයි. ඒ අනුව පරිසර දූෂණය අවම කිරීමට බෞද්ධ විකල්ප වනුයේ පරිසරය හා අන්‍යෝන්‍ය බැඳීමෙන් යුක්ත ව සදාචාරාත්මක ජීවිතයකට හුරු වීම යි.

***ප්‍රමුඛ පද:*** *අර්බුද, ආචාරධර්ම, දූෂණය, පරිසරය, බුදුදහම*